ජයතිලක කම්මැල්ලවීර



# මහින්ද රටට ඇටවූ උගුල්වල මෛත්‍රී පැටලිලා



මහින්ද රාජපක්ෂ තම පාලන කාලය තුළ රටේ ආරථිකය සේ ම දේශපාලන සදාචාරය අරබයා අටවන ලද උගුල් නිමක් නැත. ඔහු තම බලය පවත්වාගෙන යාම සඳහාත් පවුල සහ හිතමිතුරන් පෝෂණය සඳහාත් රටේ භූමිය පවා වික්කේය. ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවට රාජාණ්ඩුවක් පවත්වාගෙන යමින් පාර්ලිමේන්තුව රූකඩ මඩුවක් බවට පත්කර ගත් අතර ප්‍රතිපත්ති ගරුකබව, අවංකකම, පමණක් නොව ලජ්ජාව සහ හිරිකිතයද තම පක්ෂයට අයත් දේශපාලනඥයන් කෙරෙන් සෝද හැරියේය. ඒ අනුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් දෙතුන්දෙනෙකු හැර අනෙක් සියල්ලෝම ලජ්ජාව ගෑවිලාවත් නැති ප්‍රතිපත්ති විරහිත නිවටයන් සහ වංචාකාරයන් බවට පත් කරනු ලැබ සිටිති. ඔවුන්ට තම බඩ ගැන මිස රට ගැන කිසි හැඟීමක් නැත. ඔවුන්ට ඇත්තේ ඕනෑම පැත්තකට හරවා ඕනෑම දෙයක් කියන්නට හැකි දිවවල්ය. මේ සඳහා හොඳම උදාහරණය නිමල් සිරිපාලය.

දැන් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාට යහපාලනය ගෙන යන්නට සිදුවී ඇත්තේ එවන් පිරිසක් පාර්ලිමේන්තුවේ වැඩි බලයක් හසුරුවන තත්වයක් යටතේය. රාජපක්ෂ පාලනය යටතේ පාර්ලිමේන්තුව රූකඩ මඩුවක් බවට පත්කර තිබුණ ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව එය තවමත් ව්‍යවස්ථාදායකයයි. එනම් නීති පැනවීමේ බලය ඇත්තේ පාර්ලිමේන්තුවටයි. ඒ අනුව මෛත්‍රී ජනාධිපතිවරණයේදී රටට දුන් ප්‍රධාන පොරොන්දු ඉටු කළ යුතුව ඇත්තේ ප්‍රතිපත්ති විරහිත ගෝස්තරවාදීන්ගෙන් සමන්විත වත්මන් පාර්ලිමේන්තුව හරහාය.

> **මෛත්‍රීගේ ජයග්‍රහණය ඔහුම පවා විශ්වාස නොකළ ආශ්චර්යයක් බව ජනාධිපතිවරණය දිනයේ රාත්‍රිය ඔහු තම පවුලේ අය සමග රහසිගත තැනක ගතකළ බව හෙළිකිරීමෙන්ම පෙනේ. එසේ නම් ජයගත්තේ කෙසේද? ඒ ජයග්‍රහණයෙන් පෙන්නුම් කරන්නේ රාජපක්ෂගේ විෂකුරු පාලනයෙන් අත්මිදෙන්නට රටේ බහුතර ජනතාවගේ සිත් තුළ කැකෑරෙමේන් තිබුණු උවමනාවයි.**

එ සේ ම රාජපක්ෂ පාලනය යටතේ පොලීසිය ඇතුළු රාජ්‍ය යන්ත්‍රය ද දූෂිත පාලනයට ගැලපෙන පරිදි දූෂිත තත්වයට පත්ව තිබුණු බව අපි දනිමු. අල්ලස් හෝ දූෂණ කොම්ෂම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ආදී සෑම රාජ්‍ය ආයතනයක්ද වසර දහයක් තිස්සේ කැරකුනේ රාජපක්ෂලාට ඕනෑ හැටියට මිස නීතියකට අනුව නොවේ. අධිකරණයේ තත්වයද එය ම විය. දැන් මෛත්‍රී පාලනයට වංචා දූෂණ සම්බන්ධයෙන් කටයුතු කරන්නට සිදුවී ඇත්තේ එවන් රාජ්‍ය යන්ත්‍රයක් සමගය. එපමණක් නොවේ. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ද සුදනන් ලෙස ගත නොහැක. රනිල් වික්‍රමසිංහ දූෂිතයකු යයි කිසිවකු නොකියන බව අපි දනිමු. එහෙත් ඔහු සමග සිටින බොහෝ දෙනෙකු ද යහපාලනයකට ගැලපෙන අය යයි කිව නොහැකිය.

පවතින ආණ්ඩුව ඇත්තේ මේ පදනම් මත බව අමතක කර දින සීයේ වැඩසටහන ගැන ආඩාපාලි කීම තේරුමක් නැත. මෙයින් අදහස් කරන්නේ මෛත්‍රී පාලනයට ඔහේ යන්නට ඉඩහැර බලා සිටිය යුතු බවක් නොවේ. එ සේ ම අද සිදුවන සියල්ල අනුමත කිරීම ද නොවේ. යකුන් පෙරේතයන්ගෙන් වැඩ ගන්නා විට ඔවුන්ට දෙළ පිදේනි දිය යුතු වන බවත් ඔවුන් ලවා කරවන වැඩ අකුරටම නොකෙරෙන බවත් උන්ගේ අත්වල කුණු ඒ කරන වැඩවල ද තැවරෙන බවත් තේරුම් ගත යුතු බවය මේ කියන්නේ.

මෛත්‍රී වෙනුවෙන් ජනතාව අමතන්නට අප යොමු වූයේ මර්ධනකාරී සහ දූෂිත රාජපක්ෂ පවුල් පාලනයෙන් රට බේරා ගැනීම ඒකායන අරමුණ කරගෙන මිස මෛත්‍රී කොතරම් රට ගැන හැඟීමක් ඇති කෙනෙක්ද කොතරම් ප්‍රතිපත්ති ගරුක කෙනෙක්ද ඔහුට මේ රට මේ සමාජය යහපත් රටක් යහපත් සමාජයක් බවට පත්කරන්නට හොඳ දැක්මක් තිබේද යන කරුණු ප්‍රධාන කොට නොවන බව අපගේ හෘදය සාක්ෂියට අනුව පිළිගත යුතුව ඇත. එහෙත් ජනාධිපතිවරයා ලෙස තේරී පත්ව ගත වූ ඉතා කෙටි කාලය තුළ මෛත්‍රීපාල සිරිසේන යනු අප අපේක්ෂා කරන දිසාවට රට ගෙන යන්නට දැක්මක් ඇති, රාජපක්ෂලාගේ බලකාමයෙන් දූෂිත නොවූ නායකයකු බව ඔහු ඔප්පු කර පෙන්වා තිබේ. ජනාධිපති ක්‍රමය මුළුමනින්ම අහෝසි කළ යුතු යයි කියන ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු පිරිස් ද මෛත්‍රීගේ ධූරකාලය තුළ යම් විධායක බලයක් තබාගත්තාට වරදක් නැතැයි කියන්නේ ඒ නිසාය.

අප රටේ ජනයාට ඉතා ඉක්මණින් අතීතය අමතක වන බවට පොදු පිළිගැනීමක් තිබේ. එය ඇත්තක් බව මෛත්‍රී පාලනය ගැන අද තැනින් තැන කෙරෙන කතාවලින් ඔප්පු වෙයි. එහෙයින් අපි පසුකර ආ මෑත අතීතය කෙටියෙන් හෝ මතක් කිරීම වටී. මීට මාස දෙළහකට පෙර අප සමාජයේ තිබුණේ රාජපක්ෂ පවුල් පාලනය පෙරළන්නට සිතීම සියතින් ගෙළ වැලලාගැනීමක් ලෙසට පොදු පිළිගැනීමකි. රාජපක්ෂ පාලනයට විරුද්ධව ප්‍රසිද්ධියේ කතා කළ අය විසිතිස් ගණනකට ද අඩුය. ජාතික මට්ටමේ රූපවාහිනී, ගුවන්විදුලි, පත්තර ආදී මාධ්‍ය ආයතන සියල්ල සිටියේ රාජපක්ෂ පාලනයේ හොරණෑ හැටියටය. විරුද්ධ පක්ෂ සිටියේ කැබලිවී යමින් ආතක් පාතක් නැති තැනකය. ප්‍රධාන විරුද්ධ පක්ෂය ජනාධිපතිවරණයට මසක් තිබියදීත් නායකත්වය පිළිබඳ ගැටලුවේ පැටලී කෑලිවලට වෙන් වී තිබිණ. මේ තත්වය තුළ රාජපක්ෂ පාලනය මහින්ද රාජපක්ෂගෙන් නොනැවතී තවත් පරම්පරාවක් ඉදිරියට යන්නට නියමිතව ඇති තත්වයකි රට තුළ තිබුණේ.

2015 වන විටම ජනාධිපතිවරණයක් පැවැත්වීම ස්ථිර බව පෙනීම නිසා විපක්ෂයෙන් පොදු අපේක්ෂකයකු ඉදිරිපත් කළ යුතු බවට පිළිගැනීමක් තිබුණාද පොදු අපේක්ෂකයා කවුද යන්න ගැන තිබුණේ ඉතාමත් ව්‍යාකූල තත්වයකි. ඒ ගැන විරුද්ධ පක්ෂ අතර එකඟතාවක් ජේනමානයක වත් තිබුණේ නැත. සෝභිත හිමියන්ගේ සාධාරණ සමාජයක් සඳහා වූ ව්‍යාපාරය යම් තීරණාත්මක වැඩ කොටසක් ඉටුකරන්නට පෙරට ආවද උන්වහන්සේ පොදු අපේක්ෂකයා ලෙස පිළිගන්නට ප්‍රධාන විරුද්ධ පක්ෂවල සේ ම සිවිල් සංවිධානවලද එකඟත්වයක් ගැනීම උගහට විය. ප්‍රාදූර්භූතයක් සේ මෛත්‍රීපාල සිරිසේන එන්නේ මෙවන් වියවුල් සහගත පරිසරයකය.

මෛත්‍රීගේ ජයග්‍රහණය ඔහුම පවා විශ්වාස නොකළ ආශ්චර්යයක් බව ජනාධිපතිවරණය දිනයේ රාත්‍රිය ඔහු තම පවුලේ අය සමග රහසිගත තැනක ගතකළ බව හෙළිකිරීමෙන්ම පෙනේ. එසේ නම් ජයගත්තේ කෙසේද? ඒ ජයග්‍රහණයෙන් පෙන්නුම් කරන්නේ රාජපක්ෂගේ විෂකුරුපාලනයෙන් අත්මිදෙන්නට රටේ බහුතර ජනතාවගේ සිත් තුළ කැකෑරෙමේන් තිබුණු උවමනාවයි. මෙය සුළුජාතිකයන් කෙරෙන් වඩාත් ප්‍රකටව පෙන්නුම් කෙරුණු බව ද මෙහිලා මතක තබා ගැනීම අත්‍යවශ්‍යය.

මේ කෙටි ඉතිහාසය මතක් කර ගන්නා විට හොඳින් කරුණු මැන බලා ඉදිරි වැඩ පිළිවෙලක් රටට ඉදිරිපත් කරන්නට කාලයක් මෛත්‍රීට නොලැබුණු බව අවබෝධ කර ගැනීම අපහසු නොවේ. දින සියයේ වැඩපිළිවෙල ගැන අප සලකා බැලිය යුත්තේ එද පැවති තත්වය නිවැරදිව වටහා ගැනීමත් සමගය. රටේ දේශපාලන සංස්කෘතියේ පිරිහීමේ ප්‍රමාණයත් රාජ්‍යයේ දූෂිත තත්වයත් සැලකිල්ලට ගත් විට වසරකින් වත් නිම කළ නොහැකි වැඩපිළිවෙලකි දින සියයෙන් රටට ඉදිරිපත් වුණේ. එපමණක් නොවේ. නව ජනාධිපතිවරයා පත්වූ මොහොතේ සිටම ඔහුට උගුල් ඇටවීම, බොරුවළවල් කැපීම මහින්ද රාජපක්ෂ ඉතා සූක්ෂ්ම ලෙස ආරම්භ කළේය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වය මෛත්‍රීට බාරදීම එසේ ඇටවූ උගුල්වලින් එකකි. මගේ පුද්ගලික මතය වන්නේ මෛත්‍රී ඒ උගුලේ පැටලුණු බවය. (මේ උගුල ඇටවෙන අවස්ථාවේදීම මා මෙය ලිව්වෙමි)

මෛත්‍රී ජනාධිපති ලෙස පත්වූ විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායමෙන් සැලකියයුතු පිරිසක් ඔහුගේ නායකත්වය පිළිගන්නා බව ප්‍රකාශ කළහ. එයින් පෙනුනේ මන්ත්‍රී කණ්ඩායමෙන් බහුතරයක් මහින්දගෙන් ගැලවී එමින් සිටි බවය. එය සිදුවන්නට තව සති දෙකක් ඉඩදුන්නේ නම් පක්ෂ බහුතරය මෛත්‍රීට අවශ්‍ය පරිදි මෙහෙයවා ගන්නට හැකිවන තත්වයකි ඇතිවන්නට නියමිතව තිබුණේ. මෙය වටහා ගත් රාජපක්ෂ කළේ දනපති වෙස් ගෙන පක්ෂ සභාපති කම කඩිමුඩියේ මෛත්‍රීට පවරා දීමයි. පක්ෂය නොකැඩී ආරක්ෂා කර ගන්නට යයි කියමින් මෛත්‍රී ඒ හිරවුණේ උගුලක බව දැන් නොපෙනේද? පරාජය බාරගෙන තම නායකත්වය යටතට එන්නට සිටි මන්ත්‍රීවරුන් ලවා අල්ලසක් නොමැතිව අනුමත කරවා ගත හැකිව තිබුණු 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය වෙනුවෙන් දැන් ඒ මන්ත්‍රීවරුන්ටම දෙළපිදේනි දෙන්නට සිදුවී තිබේ. එසේ දෙළපිදේනි දීමෙන් වුවද පක්ෂය කැඩීම වළක්වා ගත නොහැකි බව නොවේද දැන් පෙනෙන්නේ. රටේ ජනතාව මෛත්‍රීට පැවරුවේ රාජපක්ෂලා විසින් ප්‍රතිපත්ති විරහිත පක්ෂයක් බවට පිරිහෙලන ලද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැදීමේ කාර්යයක් නොව රට හැදීමේ කාර්යය බව නැවතත් සිහිපත් කරන්නට සිදුවීම කණගාටුවට කරුණකි. එනිසා තවදුරටත් පක්ෂ උගුල්වල නොවැටිය යුතු බව අවධාරණය කරන්නෙමු. මෛත්‍රී ද මේ ගැන දැනුවත් බව බණ්ඩාරනායක සමරුවකදී ඔහු කළ කතාවෙන් මනාව පැහැදිලි වෙයි.